# සීමාසහිත කළුතර විවිධ සේවා සමූපකාර සමිතිය.

## තනතුරු ඇබෑර්තු

**සීමාසහිත කළුතර විවිධ සේවා සමූපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත්, කළුතර දිස්ත්‍රික්කය තුළ වසර 02 ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2025.07.30 සිට 2025.08.12 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීමේදී, සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 1.2.2 වගන්තිය අනුව සමිතියේ අභ්‍යන්තර සේවකයින් හට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.**

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | | වයස් සීමාව | පුරප් පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 101:3 | III | 30-50 | 01 | රු.**23454** - 450×10 - 520×10 - 650×10 - රු.**39654** |
| ගණකාධිකාරී | 102:5 | III | 24-45 | 01 | රු.**19804** - 320×10 - 380×10 - 450×10 - 520×05 - රු.**33904** |
| ලේකම් | 102:6 | III | 24-45 | 01 | රු.**18434** - 260×10 - 320×10 - 380×10 - 450×10 - රු.**32534** |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 102:5 | III | 26-45 | 01 | රු.**19804** - 320×10 - 380×10 - 450×10 - 520×5 - රු.**33904** |
| විගණක සහකාර | 103:7 | III | 21-45 | 03 | රු.**16994** - 220×10 - 260×10 - 320×10 - 380×05 - රු.**26894** |

01. මෙම තනතුර ස්ථිරය. සමූපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.
02. බඳවාගැනීමේ සුදුසුකම්
 ***( ආසන්නතම බස්නාහිර පළාත් සමූපකාර සමිතියකින් සුදුසුකම් ලබා ගත හැකිය)***
03. වයස් සීමාව - ( අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ) **සමූපකාර ක්ෂේත්‍රයේ ස්ථිර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ලබයි.**
04. බඳවා ගැනීමේ ක්‍රමය - **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්**
05. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර බඳවා ගැනීමේ නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත අවලංගු කල හැකිය.
06. වෙනත් සමූපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයෙකු අයදුම්පත් යොමු කරන්නේ නම් තම අයදුම්පත අයදුම්කරු දැනට සේවය කරන සමිතිය හරහාම එවිය යුතු වේ. වෙනත් සමිතියක සේවකයෙකු සෘජුවම ඉදිරිපත් කරන අයදුම්පත් කිසිදු හේතුවක් නිසාවත් සළකා බලනු නොලැබේ.
07. අයදුම්පත්‍රය යොමු කිරීම.
 - **I.** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ ඉල්ලුම් කරනු ලබන **" සී/ස කළුතර විවිධ සේවා සමූපකාර සමිතියේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම "** යන්න සඳහන් කල යුතුය.
 - **II.** සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2025.08.12** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ( **අතින් ගෙනවිත් භාර දීමට ද හැකියාව ඇත.** ) **මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**විමසීම් :-** **සභාපති,** **මෙයට,**
**සී/ස කළුතර විවිධ සේවා සමූපකාර සමිතිය,**
**නො.20, ගඟබඩ පාර,** **සභාපති**
**කළුතර.**

**දුරකථන :- 034-4943852 / 034-2222356**

# සීමාසහිත කළුතර විවිධ සේවා සමූපකාර සමිතිය

# තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම.(බාහිර)

## තනතුරු ඇබෑර්තු

සීමාසහිත කළුතර විවිධ සේවා සමූපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත්, කළුතර දිස්ත්‍රික්කය තුළ වසර 02 ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2025.07.30 දින සිට 2025.08.12 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීමේදී, සමූපකාර සේවක කාර්යය විධි විධාන සංග්‍රහයේ 1.2.2 වගන්තිය අනුව සමිතියේ අභ්‍යන්තර සේවකයින්හට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

1. **101:3** වැටුප් පරිමානයේ - සාමාන්‍යාධිකාරී තනතුර - **(III ශ්‍රේණිය)**

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | | පුරප්පාඩු සංඛ්‍යාව | වයස් සීමාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 101:3 | III | 01 | 30-50 | රු.**23454** - 450×10 - 520×10 - 650×10 = රු.**39654.00** |

**අනුමත සුදුසුකම්**

**අ) 101:3 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර 02 ක සතුටුදායක සේවා පලපුරුද්දක් හෝ 102:4 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරට වසර 03 ක සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.**

හෝ

**ආ) ජාතික සමූපකාර සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන ව්‍යාපාර කලමණාකරණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමඟ 102:5 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.**

හෝ

**ඇ) රජයේ පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ එක් අවුරුද්දකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය සමඟ අදාළ ක්ෂේත්‍රයේ විධායක/ කළමණාකරණ මට්ටමෙ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.**

හෝ

**ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමඟ අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.**

2. **102:5** වැටුප් පරිමානයේ - ගණකාධිකාරී තනතුර - **(III ශ්‍රේණිය)**

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | | පුරප්පාඩු සංඛ්‍යාව | වයස් සීමාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| ගණකාධිකාරී | 102:5 | III | 01 | 24-45 | රු.**19804** - 320×10 - 380×10 - 450×10 - 520×05 - රු.**33904** |

**බඳවාගැනීමේ සුදුසුකම් (සමූපකාර සේවකයින් බඳවා ගැනීමේ පටිපාටිය - 2011)**

**අ) 104:8 වැ.ප. ස්ථිර පොත් තබන්නා තනතුරේ වසර 08 ක් හෝ 103:7 වැ.ප පොත් තබන්නා තනතුරේ වසර 06 ක් හෝ 102:6 වැ.ප පොත් තබන්නා තනතුරේ වසර 03 ක් හෝ 104:8 වැ.ප ගිණුම් කටයුතු පිළිබඳ තනතුරක වසර වසර 10 ක හෝ 103:7 වැ.ප ගිණුම් කටයුතු පිළිබඳ වසර 08 ක සතුටුදායක සේවා පළපුරුද්ද ලබා තිබීම.**

හෝ

ආ) ගණකාධිකරණය පිළිබඳ වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සමූපකාර ඩිප්ලෝමාවක් හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම හෝ සහ සමූපකාර සමිතියක ගිණුම් කටයුතු පිළිබඳව අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්ද ලබා තිබීම.

හෝ

ඇ) ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අවසාන සහතිකය ලබා තිබීම හෝ ඊට සමාන සුදුසුකම් හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික සහතික පත්‍ර පාඨමාලාවේ මධ්‍යය පරීක්ශනය සමත්ව තිබීම හෝ සහ පිළිගත් ආයතනයක ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 05 ට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**03.102:6 වැටුප් පරිමානයේ - ලේකම් තනතුර - (III ශ්‍රේණිය)**

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | | පුරප්පාඩු සංඛ්‍යාව | වයස් සීමාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| ලේකම් | 102:6 | III | 01 | 24-45 | රු.**18434** - 260×10 - 320×10 - 380×10 - 450×10 - රු.**32534** |

**බඳවාගැනීමේ සුදුසුකම් (සමූපකාර සේවකයින් බඳවා ගැනීමේ පටිපාටිය - 2011)**

අ) **103:7** වැටුප් පරිමාණයේ කළමණාකරන සහකාර තනතුරක වසර පහක සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ) අ.පො.ස. (උ.පෙළ) සමත්වීම හෝ සමූපකාර උසස් පෙළ සමත් වීම හෝ කළමණාකරනය පිළිබඳ උසස් ජාතික සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම හෝ සහ පිළිගත් ආයතනයක ලේකම් පරිචය පිළිබඳ වසරක අධ්‍යයන කාලයක් සහිත පාඨමාලාවක් සමත්ව තිබීම.

**04.102:5 වැටුප් පරිමානයේ - ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර - (III ශ්‍රේණිය)**

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | | පුරප්පාඩු සංඛ්‍යාව | වයස් සීමාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 102:5 | III | 01 | 26-45 | රු.**19804** - 320×10 - 380×10 - 450×10 - 520×5 - රු.**33904** |

**බඳවාගැනීමේ සුදුසුකම් (සමූපකාර සේවකයින් බඳවා ගැනීමේ පටිපාටිය - 2011)**

අ) **102:6** වැටුප් පරිමාණයේ අභ්‍යන්තර විගණක ස්ථිර තනතුරක වසර තුනකට නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ) ක්ෂේත්‍රයට අදාල වසර එකකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සමූපකාර ඩිප්ලෝමාවක් සහිත **103:7** වැටුප් පරිමාණයේ ස්ථිර ගිණුම්/විගණක තනතුරක වසර පහකට නොඅඩු සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.

හෝ

ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විෂය ධාරාවේ උපාධියක් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය සහතිකය හෝ ආවසරික II සහතිකය ලබා තිබීම හෝ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත්වීම හෝ සහ පිළිගත් ආයතනයක තනතුරට අදාල ක්ෂේත්‍රයේ වසර පහකට නොඅඩු සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.

**05.103:7 වැටුප් පරිමානයේ - විගණන සහකාර තනතුර - (III ශ්‍රේණිය)**

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | | පුරප්පාඩු සංඛ්‍යාව | වයස් සීමාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| විගණන සහකාර | 103:7 | III | 03 | 21-45 | රු.**16994** - 220×10 - 260×10 - 320×10 - 380×05 - රු.**26894** |

**බඳවාගැනීමේ සුදුසුකම් (සමූපකාර සේවකයින් බඳවා ගැනීමේ පටිපාටිය - 2011)**

අ) **104:9** වැටුප් පරිමාණයේ පොත් තබන්නා, කළමණාකරන සහකාර (විගණක) යන තනතුරු වල වසර පහක් හෝ **104:8** වැටුප් පරිමාණයේ ස්ථිර පොත් තබන්නා, කළමණාකරන සහකාර (විගණක) තනතුරක වසර තුනක සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ගණකාධිකරණය ඇතුලු වාණිජ විෂයන් දෙකකට සම්මාන සහිතව සමත්වීම හෝ සමූපකාර (උ.පෙළ) විභාගයෙන් සමත්වීම හෝ සහ පිළිගත් ආයතනයක විගණන කටයුතු පිළිබඳ වසර දෙකක පලපුරුද්දක් ලබා තිබීම.

සැලකිය යුතු කරුණු -

- තනතුරට අදාල සුදුසුකම් පහත ලිපිනයට විමසා ලබා ගත හැක.
- අයදුම්පත් එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ ඉල්ලුම් කරනු ලබන "තනතුරු නාමය" සහ "සී/ස කළුතර වි.සේ.ස. සමිතිය" යනුවෙන් සඳහන් කල යුතුය.
- සමූපකාර සේවක කොමිෂන් සභාව අනුමත කර ඇති සේවකයින් සඳහා ඉහත උපරිම වයස් සීමාව බල නොපාන බව සහ සමිතිය මඟින් අයදුම්පත ඉදිරිපත් කල යුතු බව සැලකිය යුතුය.
- සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල පිටපත් සමග තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත් "ගරු සභාපති, සී/ස කළුතර විවිධ සේවා සමූපකාර සිමිතිය, අංක 20, ගහබඩ පාර, කළුතර දකුණ" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

විමසීම් :- ගරු සභාපති,
සී/ස කළුතර විවිධ සේවා සමූපකාර සමිතිය,
නො.20, ගහබඩ පාර, කළුතර.

මෙයට,

සභාපති

දුරකථන :- **034-4943852 / 034-2222356**